IslamHouse.com

51 සූරා අඣ්ඣාරියාත්

(සුළඟ)

ආයත් 1-60 දක්වා.

අල් කුර්ආනය

< Sinhala>

පරිවර්තනය

මාහිර් රම්ඩීන්
පරිවර්තක

ඉස්ලාම් හවුස් වෙබ් අඩවියේ සංස්කරණ මණ්ඩලය

විචාරය කිරීම

ترجمة معاني القرآن الكريم

سورة الذاريات- 51

القرآن الكريم

ترجمة:

ماهر رمدين

مراجعة:

محمد آساد ونخبة من العلماء الكرام

المكتب التعاوني للدعوة وتوعية الجاليات بالربوة
هاتف: ٠٠٩٦٦١١٤٤٥٤٩٠٠+ فاكس: ٩٦٦١١٤٩٧٠١٢٦+ ص ب: ٢٩٤٦٥ الرياض: ١١٤٥٧
ISLAMIC PROPAGATION OFFICE IN RABWAH
P.O.BOX 29465 RIYADH 11457 TEL: +966 11 4454900 FAX: +966 11 4970126
OFFICERABWAH

51 සූරත් අ^zස්-^zසාරියාත් (සුළඟ)

මක්කාහ්වෙහි දී හෙළිදරව් කෙරුණකි.

ආයාත් (වැකි) 1-60 කි.

بِسْمِ اللهِ الرَّحْمنِ الرَّحِيْمِ

අපරිමිත දයාන්විත අසමසම කරුණාන්විත අල්ලාහ්ගේ නාමයෙනි.

1-14 නැවත නැගිටුවනු ලැබීම ස්ථිරය.

දූවිලි විසුරුවමින් දූවිලි නංවන සුළං මත දිවුරමින්.	وَالذَّارِيَاتِ ذَرْوًا {1}
(වැසි) බර උසුලන වළාකුළු මත දිවුරමින්.	فَالْحَامِلَاتِ وِقْرًا {2}
පහසුවෙන් යාත්‍රා කරන නැව් මත දිවුරමින්.	فَالْجَارِيَاتِ يُسْرًا {3}
(වැසි) කටයුතු බෙදා හරින මලාඉකාවරුන් මත දිවුරමින්.	فَالْمُقَسِّمَاتِ أَمْرًا {4}
නියත වශයෙන්ම නුඹලාට පොරොන්දු දෙනු ලැබූ දෑ සත්‍යයක්මය.	إِنَّمَا تُوعَدُونَ لَصَادِقٌ {5}
තවද නියත වශයෙන්ම විනිශ්චය සිදුවන්නක්මය.	وَإِنَّ الدِّينَ لَوَاقِعٌ {6}
විවිධ මාර්ගවලින් යුත් අහස මත දිවුරමින්.	وَالسَّمَاءِ ذَاتِ الْحُبُكِ {7}
නියත වශයෙන්ම නුඹලා විවිධ ප්‍රකාශ අතරය.	إِنَّكُمْ لَفِي قَوْلٍ مُخْتَلِفٍ {8}
(සත්‍යය දැයින්) හරවනු ලැබූවන් ඔහුගෙන් හරවනු ලබයි.	يُؤْفَكُ عَنْهُ مَنْ أُفِكَ {9}
බොරුකාරයින් ශාප කරනු ලැබීය.	قُتِلَ الْخَرَّاصُونَ {10}

الَّذِينَ هُمْ فِي غَمْرَةٍ سَاهُونَ {11}

ඔවුන් වනාහි අවුල්ජාලයෙහි ගිලිහී නොසැලකිලිමත් වූවෝ වෙති.

يَسْأَلُونَ أَيَّانَ يَوْمُ الدِّينِ {12}

විනිශ්චය දිනය කවදා දැයි ඔවුහු විමසති.

يَوْمَ هُمْ عَلَى النَّارِ يُفْتَنُونَ {13}

)එය නිරා) ගින්න මත ඔවුහු දඬුවම් කරනු ලබන දිනයයි.

ذُوقُوا فِتْنَتَكُمْ هَٰذَا الَّذِي كُنْتُمْ بِهِ تَسْتَعْجِلُونَ {14}

කවර දෙයක් පිළිබඳ නුඹලා ඉක්මණින් පතමින් සිටියහු ද එවන් නුඹලාගේ පරීක්ෂණය නුඹලා රස විඳිනු.

15-19 දේව බිය හැඟීම සහ එහි ප්‍රතිඵල.

إِنَّ الْمُتَّقِينَ فِي جَنَّاتٍ وَعُيُونٍ {15}

නියත වශයෙන්ම බිය බැතිමතුන් (ස්වර්ග) උයන්හි හා උල්පත් වලය.

آخِذِينَ مَا آتَاهُمْ رَبُّهُمْ ۚ إِنَّهُمْ كَانُوا قَبْلَ ذَٰلِكَ مُحْسِنِينَ {16}

ඔවුන්ගේ පරමාධිපති ඔවුනට පිරිනැමූ දෑ ලබා ගන්නන් වශයෙනි. නියත වශයෙන්ම ඔවුහු එයට පෙර දැහැමියන් ලෙස සිටියෝය.

كَانُوا قَلِيلًا مِنَ اللَّيْلِ مَا يَهْجَعُونَ {17}

ඔවුහු (සලාතය සඳහා අවදි ව) රාත්‍රියෙහි ස්වල්ප කාලයක් නිදාගන්නන් වූහ.

وَبِالْأَسْحَارِ هُمْ يَسْتَغْفِرُونَ {18}

තවද අලුයම් කාලයන්හි ඔවුහු (පාපොච්චරණය කරමින්) සමාව අයැදිති.

وَفِي أَمْوَالِهِمْ حَقٌّ لِلسَّائِلِ وَالْمَحْرُومِ {19}

තවද ඉල්ලා සිටින්නාට හා (ධනය) වළක්වනු ලැබූවන්ට ඔවුන්ගේ ධනයෙන් (දන්දීම) උරුමයක් විය.

20-23 මහපොළොවේ සහ මිනිසා තුළ දකින්නට ඇති අල්ලාහ්ගේ සාධක සහ පෝෂණයේ යථාර්ථය.

وَفِي الْأَرْضِ آيَاتٌ لِلْمُوقِنِينَ {20}	තවද තරයේ විශ්වාස කරන්නන්හට මහපොළොවේ සංඥාවන් ඇත.
وَفِي أَنْفُسِكُمْ ۚ أَفَلَا تُبْصِرُونَ {21}	තවද නුඹලා තුළ ද (සංඥාවන් ඇත). එහෙයින් නුඹලා අවධානයෙන් නොබලන්නෙහු ද?
وَفِي السَّمَاءِ رِزْقُكُمْ وَمَا تُوعَدُونَ {22}	තවද නුඹලාගේ පෝෂණය හා නුඹලාට ප්‍රතිඥා දෙනු ලැබූ දෑ අහස තුළ තිබේ.
فَوَرَبِّ السَّمَاءِ وَالْأَرْضِ إِنَّهُ لَحَقٌّ مِثْلَ مَا أَنَّكُمْ تَنْطِقُونَ {23}	අහස්හි හා මහපොළොවේ හිමිපාණන් මත දිවුරමින්. නියත වශයෙන්ම නුඹලා කතා කරනවාක් මෙන් සැබැවින්ම එය සත්‍යයක්මය.

24-30 ඉබ්‍රාහීම් (අලෛහිස් සලාම්) තුමා වෙත පැමිණි ආගන්තුක මලක්වරුන්.

هَلْ أَتَاكَ حَدِيثُ ضَيْفِ إِبْرَاهِيمَ الْمُكْرَمِينَ {24}	ඉබ්‍රාහීම්ගේ සම්භාවනීය ආගන්තුකයින්ගේ කතාව නුඹ වෙත පැමිණියේ ද?
إِذْ دَخَلُوا عَلَيْهِ فَقَالُوا سَلَامًا ۖ قَالَ سَلَامٌ قَوْمٌ مُنْكَرُونَ {25}	ඔවුහු ඔහු වෙත පිවිසුණු අවස්ථාවේ ඔවුහු සලාම් (සාමය) යැයි පැවසූහ. ඔහු ද සලාම්(සාමයයි) පැවසීය. නාඳුනන පිරිසක෴ (යැයි සිතුවේය.)
فَرَاغَ إِلَىٰ أَهْلِهِ فَجَاءَ بِعِجْلٍ سَمِينٍ {26}	එසැණින් ඔහු තම පවුල වෙත ගොස් බැඳපු (පුෂ්ටිමත්) වසුපැටවකු ගෙන ආවේය.

ඔහු එය ඔවුන් වෙත සමීප කරවීය. (ඔවුන් එයින් වැළකී සිටිනු දැක) “නුඹලා අනුභව නොකරන්නෙහු දැ”යි ඔහු විමසීය.	فَقَرَّبَهُ إِلَيْهِمْ قَالَ أَلَا تَأْكُلُونَ {27}
ඔවුන් ගැන බියක් ඔහු තුළ ඇතුනි.)එවිට(“නුඹ බිය නොවනු”යි ඔවුහු පැවසූහ. තවද ඥානවන්ත දරුවකු පිළිබඳ ව ඔවුහු ඔහුට ශුභාරංචි දන්වා සිටියහ.	فَأَوْجَسَ مِنْهُمْ خِيفَةً ۖ قَالُوا لَا تَخَفْ ۖ وَبَشَّرُوهُ بِغُلَامٍ عَلِيمٍ {28}
එවිට ඔහුගේ බිරිය හඬ නගමින් ඉදිරියට පැමිණ ඇයගේ මුහුණට ඇය ගසා ගනිමින් (තමන්) “වයෝවෘද්ධ වඳ කතක්” යැයි පැවසුවාය.	فَأَقْبَلَتِ امْرَأَتُهُ فِي صَرَّةٍ فَصَكَّتْ وَجْهَهَا وَقَالَتْ عَجُوزٌ عَقِيمٌ {29}
“නුඹලාගේ පරමාධිපති පැවසුවේ එලෙසය. නියත වශයෙන්ම ඔහු සර්ව ඥානී මහා ප්‍රඥාවන්තයාය.” යැයි ඔවුහු පැවසූහ.	قَالُوا كَذَٰلِكِ قَالَ رَبُّكِ ۖ إِنَّهُ هُوَ الْحَكِيمُ الْعَلِيمُ {30}

31-37. ලූත් සමූහයාගේ විනාශය.

අහෝ එවනු ලැබූ දූතයිනි! එසේනම් නුඹලාගේ දූත පණිවිඩය කුමක් දැ?යි ඔහු (ඉබ්‍රාහීම්) විමසීය.	قَالَ فَمَا خَطْبُكُمْ أَيُّهَا الْمُرْسَلُونَ {31}
“සාපරාධි පිරිසක් වෙත නියත වශයෙන්ම අපි එවනු ලැබුවෙමු” යැයි ඔවුහු පැවසූහ.	قَالُوا إِنَّا أُرْسِلْنَا إِلَىٰ قَوْمٍ مُجْرِمِينَ {32}
“මැටියෙන් යුත් ගල් (වර්ෂාවක්) ඔවුන් වෙත අප එවනු පිණිස.”	لِنُرْسِلَ عَلَيْهِمْ حِجَارَةً مِنْ طِينٍ {33}

مُسَوَّمَةً عِنْدَ رَبِّكَ
لِلْمُسْرِفِينَ {34}

“සීමාව ඉක්මවා ගියවුන් සඳහා
නුඹගේ පරමාධිපති වෙතින්
සලකුණු තබනු ලැබූවක් ලෙසින්”

فَأَخْرَجْنَا مَنْ كَانَ فِيهَا مِنَ
الْمُؤْمِنِينَ {35}

එවිට එහි සිටියවුන් අතරින්
දෙවියන් විශ්වාස කරන්නන් අපි
බැහැර කළෙමු.

فَمَا وَجَدْنَا فِيهَا غَيْرَ بَيْتٍ مِنَ
الْمُسْلِمِينَ {36}

එහෙයින් අවනතවන්නන් අතුරින්
එක් නිවසක් හැර එහි (වෙනත්
කිසිදු නිවසක්) නොදුටුවෙමු.

وَتَرَكْنَا فِيهَا آيَةً لِلَّذِينَ يَخَافُونَ
الْعَذَابَ الْأَلِيمَ {37}

තවද වේදනීය දඬුවමට බියවන්නන්
හට අපි එහි සංඥාවක් (අත හැර
දමා) ඉතිරි කළෙමු.

38-46 ඇතැම් නබිවරුන් තම බොරුකාර ජන සමූහයා සමග ක්‍රියා කළ
අයුරු සහ ඔවුනට අත් වූ අවසන් ඉරණම.

وَفِي مُوسَىٰ إِذْ أَرْسَلْنَاهُ إِلَىٰ فِرْعَوْنَ
بِسُلْطَانٍ مُبِينٍ {38}

තවද මූසා තුළ ද අපි ඔහු ෆිර්අවුන්
වෙත පැහැදිලි බලයක් සමග එවූ
අවස්ථාවේ (සංඥාවක්) විය.

فَتَوَلَّىٰ بِرُكْنِهِ وَقَالَ سَاحِرٌ أَوْ
مَجْنُونٌ {39}

එවිට ඔහු (ෆිර්අවුන්) ඔහුගේ බල
ඇණිය හේතුවෙන් (විශ්වාස
කිරීමට) පිටුපෑවේය. තවද (මූසා)
“හූනියම් කරුවෙකි. එසේ
නැතහොත් උම්මත්තකයෙකි” යැයි
ඔහු පැවසීය.

فَأَخَذْنَاهُ وَجُنُودَهُ فَنَبَذْنَاهُمْ فِي الْيَمِّ
وَهُوَ مُلِيمٌ {40}

එවිට අපි ඔහු හා ඔහුගේ සේනාව
ග්‍රහණය කළෙමු. එවිට ඔහු දොස්
නගනු ලැබූවෙකු ලෙසින් අපි ඔවුන්
මුහුදට හෙළුවෙමු.

وَفِي عَادٍ إِذْ أَرْسَلْنَا عَلَيْهِمُ الرِّيحَ الْعَقِيمَ {41}

තවද ආද් ජනයා තුළ ද ඔවුන් වෙත අපි වනසන සුළඟක් එවූ අවස්ථාවේ ද (සංඥාවක්) විය.

مَا تَذَرُ مِنْ شَيْءٍ أَتَتْ عَلَيْهِ إِلَّا جَعَلَتْهُ كَالرَّمِيمِ {42}

ඒ වෙත පැමිණි කිසිවෙක් හෝ එය දිරාපත් නටබුන් මෙන් පත් කළාක් මිස අත්හැරියේ නැත.

وَفِي ثَمُودَ إِذْ قِيلَ لَهُمْ تَمَتَّعُوا حَتَّىٰ حِينٍ {43}

තවද සමූද් ජනයා තුළ ද "නුඹලා ටික කලකට භුක්ති විඳිනු" යැයි කියනු ලැබූ අවස්ථාවේ ද (සංඥාවක්) විය.

فَعَتَوْا عَنْ أَمْرِ رَبِّهِمْ فَأَخَذَتْهُمُ الصَّاعِقَةُ وَهُمْ يَنْظُرُونَ {44}

නමුත් ඔවුන්ගේ පරමාධිපතිගේ නියෝගයට ඔවුහු අකීකරු වූහ. එවිට ඔවුන් බලා සිටියදීම අකුණු පහර ඔවුන් ග්‍රහණය කළේය.

فَمَا اسْتَطَاعُوا مِنْ قِيَامٍ وَمَا كَانُوا مُنْتَصِرِينَ {45}

එවිට සිට ගැනීමට පවා ඔවුනට නොහැකි විය. තවද ඔවුහු තමන්ටම උදව් කරගන්නන් නොවූහ.

وَقَوْمَ نُوحٍ مِنْ قَبْلُ ۖ إِنَّهُمْ كَانُوا قَوْمًا فَاسِقِينَ {46}

තවද මීට පෙර නූහ්ගේ ජනයා ද (අපි ග්‍රහණය කළෙමු.) නියත වශයෙන්ම ඔවුහු නොහොබිනා පිරිසක් වූහ.

47-51 විශ්වයේ විද්‍යාමාන අල්ලාහ්ගේ බලය සහ ඔහුගේ ඒකීයභාවය.

وَالسَّمَاءَ بَنَيْنَاهَا بِأَيْدٍ وَإِنَّا لَمُوسِعُونَ {47}

තවද අහස අපි එය ශක්තිමත් ව ඉදි කළෙමු. තවද නියත වශයෙන්ම අපි ව්‍යාප්ත කළවුන් වෙමු.

وَالْأَرْضَ فَرَشْنَاهَا فَنِعْمَ الْمَاهِدُونَ {48}

තවද මහපොළොව, අපි එය දිග හැරියෙමු. (විධිමත් ව) දිග හැරියවුන් යහපත් විය.

وَمِنْ كُلِّ شَيْءٍ خَلَقْنَا زَوْجَيْنِ لَعَلَّكُمْ تَذَكَّرُونَ {49}

නුඹලා මෙනෙහි කළ හැකි වනු පිණිස සෑම දෙයක්ම යුගල වශයෙන්ම අපි මැව්වෙමු.

فَفِرُّوا إِلَى اللَّهِ ۖ إِنِّي لَكُمْ مِنْهُ نَذِيرٌ مُبِينٌ {50}

එහෙයින් නුඹලා අල්ලාහ් වෙත වේගයෙන් යනු. නියත වශයෙන්ම මම නුඹලා සඳහා පැමිණි ඔහුගෙන් වූ පැහැදිලි අනතුරු හඟවන්නෙකි.

وَلَا تَجْعَلُوا مَعَ اللَّهِ إِلَٰهًا آخَرَ ۖ إِنِّي لَكُمْ مِنْهُ نَذِيرٌ مُبِينٌ {51}

තවද නුඹලා අල්ලාහ් සමග වෙනත් දෙවියෙකු පත් නොකරනු. නියත වශයෙන්ම මම ඔහුගෙන් නුඹලා සඳහා පැමිණි පැහැදිලි අවවාද කරන්නෙකු වෙමි.

52-55 තම දහම් දූතයින් පිළිබඳ දේව ප්‍රතික්ෂේපකයින්ගේ ස්ථාවරය සහ අල්ලාහ්ගේ දූතයාණන් වෙත කෙරෙන නියෝගය.

كَذَٰلِكَ مَا أَتَى الَّذِينَ مِنْ قَبْلِهِمْ مِنْ رَسُولٍ إِلَّا قَالُوا سَاحِرٌ أَوْ مَجْنُونٌ {52}

එලෙසය ඔවුනට පෙර සිටියවුන් වෙත යම් දහම් දූතයකු පැමිණි විට හූනියම් කරුවෙකි නැතහොත් උම්මත්තකයෙකි යැයි ඔවුහු පැවසුවා මිස නොවීය.

أَتَوَاصَوْا بِهِ ۚ بَلْ هُمْ قَوْمٌ طَاغُونَ {53}

ඔවුන් එකිනෙකා මේ ගැන උපදෙස් දෙන්නෝ ද? එසේ නොව ඔවුන් සීමාව ඉක්මවා ගිය පිරිසකි.

فَتَوَلَّ عَنْهُمْ فَمَا أَنْتَ بِمَلُومٍ {54}

එහෙයින් නුඹ ඔවුන්ගෙන් හැරී යනු. හේතුව නුඹ දොස් නගනු ලබන්නෙකු නොවනු ඇත.

وَذَكِّرْ فَإِنَّ الذِّكْرَىٰ تَنْفَعُ الْمُؤْمِنِينَ {55}

තවද නුඹ මෙනෙහි කරනු. හේතුව නියත වශයෙන්ම මෙනෙහි කිරීම දේව විශ්වාසවන්තයින්ට ප්‍රයෝජනවත් වනු ඇත.

56-58 ජින් වර්ගයා සහ මිනිස් වර්ගයා මැවීමෙහි යථාර්ථය.

තවද ජින් වර්ගයා හා මානව වර්ගයා වන ඔවුන් මට ගැතිකම් කිරීමට මිස මම නොමැව්වෙමි.	وَمَا خَلَقْتُ الْجِنَّ وَالْإِنْسَ إِلَّا لِيَعْبُدُونِ {56}
ඔවුන්ගෙන් මම කිසිදු පෝෂණයක් අපේක්ෂා නොකරමි. එමෙන්ම ඔවුන් මට ආහාර සැපයිය යුතු යැයි ද මම අපේක්ෂා නොකරමි.	مَا أُرِيدُ مِنْهُمْ مِنْ رِزْقٍ وَمَا أُرِيدُ أَنْ يُطْعِمُونِ {57}
නියත වශයෙන්ම අල්ලාහ් වන ඔහු ස්ථාවර බලය ඇති මහා පෝෂකයාය.	إِنَّ اللَّهَ هُوَ الرَّزَّاقُ ذُو الْقُوَّةِ الْمَتِينُ {58}

59,60 දේව ප්‍රතික්ෂේපකයින් සතු අවසන් ඉරණම.

එහෙයින් නියත වශයෙන්ම අපරාධ කළවුන් වනාහි ඔවුන්ගේ සගයින්ගේ පාපයන් මෙන් පාපයන් ඔවුනට ඇත. එහෙයින් ඔවුහු (දඬුවම) ඉක්මන් කරන්නැයි මගෙන් නොපැතිය යුතුය.	فَإِنَّ لِلَّذِينَ ظَلَمُوا ذَنُوبًا مِثْلَ ذَنُوبِ أَصْحَابِهِمْ فَلَا يَسْتَعْجِلُونِ {59}
ප්‍රතික්ෂේප කළවුනට, ඔවුනට ප්‍රතිඥා දෙනු ලැබුනු ඔවුන්ගේ දිනයේ විනාශය ඇත.	فَوَيْلٌ لِلَّذِينَ كَفَرُوا مِنْ يَوْمِهِمُ الَّذِي يُوعَدُونَ {60}

IslamHouse.com